FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2022 ජූලි
2 වන වෙළුම - කලාප අංක 7


සිරස මාධ්‍යවේදීන්ට පොලිසිය පහරදෙයි
මාධ්‍යවේදීන්ට හමුදාවෙන් ප්‍රහාර
උද්ඝෝෂණය කළැයි, ඉස්මත් මවුලවි අත්අඩංගුවට

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට / සංරචකයන්ට අදාළ සිදුවීම් 28ක් 2022 ජූලි මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 10ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 16ක්, මාධ්‍යයේ ස්වාධීනත්වයට අදාළ සිදුවීම් 01ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යටතට ගැනෙන සිදුවීම් 01ක් ඒ අතර වෙයි. මෙවරද වාර්තා වූ සිදුවීම්වලින් බහුතරයක්, ජනාධිපතිවරයාට ඉල්ලා අස් වන ලෙස බල කරමින් රට පුරා පැනනැගුණු මහජන නැගිටීමට සම්බන්ධ සිදුවීම් වේ. මාධ්‍යවේදීන්ට හා ක්‍රියාකාරිකයන්ට පහරදීමේ හා අත්අඩංගුවට ගැනීමේ සිදුවීම්වල පැහැදිලි වර්ධනයක් ජූලි මාසය තුළ පෙන්නුම් කරයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. ගාලු කොටු පවුරමත විරෝධතාවට හමුදාව බාධා කිරීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම.
2. රක්ෂිත බන්ධනාගාරගතව සිට ඇප මත මුදාහැරුණු ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ අමල් සංජීව හමුදා භාරයට පත් කිරීම.
3. භික්ෂූන්වහන්සේලා විසින් සංවිධානය කර තිබූ සත්‍යග්‍රහයකට එරෙහිව, පොලිසිය අධිකරණයෙන් තහනම් නියෝගයක් ලබා ගැනීම.
4. විරෝධතාවලට එරෙහිව මිලිටරි බලය යෙදවීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් යොමු කිරීම.
5. රක්ෂිත බන්ධනාගාරගත කර සිටි අරගලයේ ක්‍රියාකාරිකයින් තිදෙනෙකු ඇප මත නිදහස් කිරීම.
6. ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයින් වන ධිලාන් සේනානායක සහ අනුරුද්ධ බණ්ඩාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.

7. පොලිස්පතිවරයා විසින් ජුලි 8 වැනිදා සිට නැවත දැනුම් දෙන තුරු පොලිස් ඇඳිරිනීතිය පැනවීම.

8. ජුලි 9 වැනිදා ජනාධිපති මන්දිරය අසල පැවති උද්ඝෝෂණයේදී මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසක් ප්‍රහාරයට ලක්වීම.

9. ජාතික රූපවාහිනියට ඇතුළු වූ උද්ඝෝෂකයින් පිරිසක් එහි වැඩසටහන් අන්තර්ගතය සම්බන්ධයෙන් බලපෑම් කිරීම.

10. ජුලි 18 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන ජනාධිපතිවරයා විසින් හදිසිනීතිය පැනවීම සම්බන්ධයෙන් නීතිඥ සංගමය විරෝධය පළ කිරීම.

11. ඉන්ධන පිරවුම්හලකදී හමුදා නිලධාරියෙක් සිවිල් වැසියකුට පයින් පහර දෙන දර්ශනය වීඩියෝගත කළ පුරවැසියකු තර්ජනයට ලක් වීම.

12. ජනාධිපති මන්දිරය අසල උද්ඝෝෂණයක නිරත වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු 09 දෙනෙක් අත්අඩංගුවට ගැනීම.

13. ජුලි 09 වැනිදා අගමැතිවරයාගේ පෞද්ගලික නිවස අසල උද්ඝෝෂණයක් වාර්තා කරමින් සිටි සිරස මාධ්‍යවේදීන්ට පහරදීම.

14. පොල්දූව මංසන්ධිය අසල විරෝධතාවලට ආරක්ෂක අංශ එල්ල කළ ප්‍රහාරවලින් උද්ඝෝෂකයින් පිරිසක් තුවාල ලැබීම.

15. ඇඹිලිපිටියේ අරගලභූමියේ සිටි උද්ඝෝෂකයන්ට මැර ප්‍රහාරයක් එල්ල වීම.

16. ජනාධිපති ලේකම් කාර්යාලය තුළ සහ ඒ අවට රැඳී සිටි අරගලකරුවන්ට හා සිදුවීම වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන්ට පහරදීම.

17. ගාලුමුවදොර බණ්ඩාරනායක ප්‍රතිමාව අසල රැඳී සිටි අරගලකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

18. වැල්ලවායේ මාධ්‍යවේදී ඉන්දික ගරුසිංහ පළ කළ ෆේස්බුක් පෝස්ටුවක් සම්බන්ධයෙන් පොලිස් නිලධාරියකු කළ පැමිණිල්ලක් මත මාධ්‍යවේදියා පොලිසියට කැඳවීම.

19. ජන අරගලයේ ක්‍රියාකාරිකයකු හා නිදහස් මාධ්‍යවේදියකු වන ඇන්තනි වේරංග පුෂ්පික ද සිල්වා අත්අඩංගුවට ගැනීම.

20. අරගලයේ ක්‍රියාකාරිකයකු වූ පැතුම් කර්නර් අත්අඩංගුවට ගැනීම.

21. වැඩබලන ජනාධිපතිවරයා විසින් හදිසි නීතිය පැනවීම හා පාර්ලිමේන්තුව මගින් එය සම්මත කිරීම.

22. ඉන්ධන පිරවුම්හලක් අසලදී පොලිස් පහරදීමක් වීඩියෝගතකළ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ රවීෂ තිලකවර්ධන පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.

23. අරගලයේ ප්‍රමුඛ ක්‍රියාකාරිකයන් 6 දෙනෙකුට විදෙස් ගමන් තහනම් කරමින් අධිකරණය නියෝගයක් පැනවීම.

24. අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ධානිෂ් අලි ගුවන්යානයක් තුළදී අත්අඩංගුවට ගැනීම.

25. ජනාධිපතිවරයා විසින් නිකුත් කර ඇති හදිසි නීති රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදනය බල රහිත කරන ලෙස ඉල්ලා මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.

26. Xposure News මාධ්‍ය ආයතනයේ කාර්යාලය පිහිටි නිවාස සංකීර්ණයට ඇතුළු වූ නාඳුනන පිරිසක් එහි සේවය කරන මාධ්‍යවේදීන් පිළිබඳ තොරතුරු විමසීම.

27. 'ගෝඨාගෝගම' ප්‍රහාරයේ වින්දිතයන්ට පොලිසිය වන්දි ගෙවිය යුතු යැයි මානව හිමිකම් කොමිසම තීරණය කිරීම.

28. උද්ඝෝෂණයකට සහභාගි වීම හේතුවෙන් බේරුවල ඉස්මත් මවුලවි අත්අඩංගුවට ගැනීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 ජුලි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 10 |
| නීතිමය කොන්දේසි | 16 |
| මාධ්‍යයේ ස්වාධීනත්වය | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 01 |
| **එකතුව** | **28** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස බරපතළ ලෙස උල්ලංඝනය වූ අවස්ථා 10ක් ජූලි මාසයේදී නිරීක්ෂණය විය.**

**2 වගුව: 2022 ජූලි : ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 10**

| **දර්ශකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| ප්‍රහාර | 05 |
| මානසික බලපෑම් | 05 |
| **එකතුව** | **10** |

01. **ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයින් වන ඩිලාන් සේනානායක සහ අනුරුද්ධ බණ්ඩාර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීම.**

ඔවුන් දෙදෙනාම ජූලි 4 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබිණි. අරගලය සම්බන්ධයෙන් ෆේස්බුක් ලයිව් ඔස්සේ තොරතුරු ප්‍රචාරය කිරීම ඇතුළු සමාජ මාධ්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඩිලාන් සේනානායකගෙන්ද ජූලි 9 වැනිදා පැවැත්වීමට නියමිත විරෝධතාව පිළිබඳව පළ කළ සමාජ මාධ්‍ය පෝස්ටුවක් පිළිබඳව අනුරුද්ධ බණ්ඩාරගෙන්ද ප්‍රශ්න කර තිබේ.

මූලාශ්‍රය: https://www.facebook.com

02. **පොලිස්පතිවරයා විසින් ජූලි 8 වැනිදා සිට නැවත දැනුම් දෙන තුරු පොලිස් ඇඳිරිනීතිය පැනවීම.**

බස්නාහිර පළාතේ පොලිස් බල ප්‍රදේශ 7ක් සඳහා මෙම නියෝගය පනවා තිබූ අතර එවැනි නියෝගයක් පැනවීමට පොලිස්පතිවරයාට බලයක් නොමැති බවට නීතිඥ සංගමය ඇතුළු නීති ක්ෂේත්‍රයේ ප්‍රවීණයින් විසින්ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින්ද පෙන්වා දෙන ලදි. ජූලි 9 වැනිදා උදෑසන අදාළ නියෝගය පොලිස්පතිවරයා විසින් ඉවත් කර ගැනිණි. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද මෙම නියෝගයට විරෝධය පළ කරමින් නිවේදනයක් නිකුත් කළේය.

මූලාශ්‍රය: https://www.bbc.com

03. **ජූලි 9 වැනිදා ජනාධිපති මන්දිරය අසල පැවති උද්ඝෝෂණයේදී මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසක් ප්‍රහාරයට ලක්වීම.**

මෙම ප්‍රහාරවලින් මාධ්‍යවේදීන් 11 දෙනෙකු ඇතුළුව 113 දෙනෙක් කොළඹ ජාතික රෝහලට ඇතුළත් කෙරුණු අතර පසු දින (ජූලි 10) වන විට රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලැබූ සංඛ්‍යාව 22කි. ජනාධිපති මන්දිරයේ පිවිසුම් දොරටුව අසලදී හමුදාව සිදු කළ වෙඩි තැබීමෙන් බරපතළ ලෙස තුවාල ලැබූ මාතර පදිංචි ජනක ලලිත් ජයසේන සැත්කමකට භාජනය කෙරිණි. විරෝධතාකරුවන් ඉලක්ක කොට වෙඩි තැබූ බවට නැගුණු චෝදනාව යුද හමුදාව ප්‍රතික්ෂේප කළේය.

මූලාශ්‍ර: 1. https://mawbima.lk
2. https://www.runews.lk

04. **ඉන්ධන පිරවුම්හලකදී හමුදා නිලධාරියෙක් සිවිල් වැසියකුට පයින් පහර දෙන දර්ශනය වීඩියෝගත කළ පුරවැසියකු තර්ජනයට ලක් වීම.**

ජූලි 3 වැනිදා කුරුණෑගල යක්ගහපිටිය පිරවුම්හලේදී සිදු වූ එම පහරදීම වීඩියෝගත කොට සමාජ මාධ්‍යයට මුදාහැරීමෙන් පසුව, එම ප්‍රහාරය සිදු කළ ලුතිනන් කර්නල් විරාජ් කුමාරසිංහ නැමති නිලධාරියා තමන්ට දුරකථනයෙන් තර්ජනය කළ බව, එම දර්ශනය වීඩියෝ ගත කළ රසික හේරත් මාධ්‍ය වෙත ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: https://www.bbc.com/sinhala

05. **ජූලි 09 වැනිදා අගමැතිවරයාගේ පෞද්ගලික නිවස අසල උද්ඝෝෂණයක් වාර්තා කරමින් සිටි සිරස මාධ්‍යවේදීන්ට පහරදීම.**

මාධ්‍යවේදීන් ඉලක්ක කොට, පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් එල්ල කරන ලද මෙම ප්‍රහාරයෙන් සරසි පීරිස්, ජුඩීන් සින්දුජන්, ජනිත් මෙන්ඩිස්, වරුණ සම්පත්, කාලිමුත්තු චන්ද්‍රන්, වානුක වීරකෝන්, බනිඳු ලෝකුරුගේ යන මාධ්‍යවේදීන් රෝහල්ගත කෙරිණි. ප්‍රහාරයට අණ

දුන් පොලිස් විශේෂ කාර්ය බලකායේ (STF) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොමේෂ් ලියනගේ වැඩ තහනමට ලක් කළ අතර ජූලි 21 වැනිදා සිට නැවත සේවයේ පිහිටුවන ලදි.

මූලාශ්‍රය: https://www.youtube.com

06. **පොල්දූව මංසන්ධිය අසල විරෝධතාවලට ආරක්ෂක අංශ එල්ල කළ ප්‍රහාරවලින් උද්ඝෝෂකයින් පිරිසක් තුවාල ලැබීම.**

ජූලි 13 වැනිදා පැවති මෙම උද්ඝෝෂණය විසුරුවාහැරීම සඳහා කඳුළු ගෑස් හා ජල ප්‍රහාරවලට අමතරව බැටන් ප්‍රහාරද එල්ල කෙරුණු අතර එහිදී තුවාල ලැබූ 84 දෙනෙකු කොළඹ ජාතික රෝහලට ඇතුළත් කරන ලදි. ඒ අතර ජනමාධ්‍යවේදීන් දෙදෙනෙකුද සිටින බව වාර්තා වුවද ඔවුන් පිළිබඳ වැඩිදුර තොරතුරු සපයාගැනීමට නොහැකි විය.

මූලාශ්‍රය: https://www.facebook.com

07. **ඇඹිලිපිටියේ අරගලභූමියේ සිටි උද්ඝෝෂකයන්ට මැර ප්‍රහාරයක් එල්ල වීම.**

ඇඹිලිපිටිය නගරසභාව ඉදිරිපිට අඛණ්ඩව උද්ඝෝෂණයේ නිරත වී සිටි පිරිස අතරට 20 වැනිදා රාත්‍රියේ පොලු මුගුරු අතැතිව කඩාවැදුණු මැර පිරිසක් මෙම ප්‍රහාරය එල්ල කර ඇත. තුවාල ලැබූ එක් අයෙක් ඇඹිලිපිටිය රෝහලට ඇතුළත් කෙරිණි.

මූලාශ්‍රය: https://www.youtube.com

08. **ජනාධිපති ලේකම් කාර්යාලය තුළ සහ ඒ අවට රැඳී සිටි අරගලකරුවන්ට හා සිදුවීම වාර්තා කිරීමට ගිය මාධ්‍යවේදීන්ට පහරදීම.**

ජූලි 22 වැනිදා අලුයම් කාලයේ මෙම ප්‍රහාරය එල්ල කෙරුණු අතර ආරක්ෂක හමුදා හා පොලිස් නිලධාරීන්ට අමතරව අනන්‍යතාව හෙළි නොවූ අතුරු හමුදා සාමාජිකයින් පිරිසක්ද ඊට සහභාගී වූ බවට චෝදනා එල්ල විය. කසුන් කුමාරගේ, චතුරංග ප්‍රදීප් කුමාර යන මාධ්‍යවේදීන් හමුදාව විසින් පැය කිහිපයක් තිස්සේ රහසිගතව රඳවා තබාගෙන දරුණු ලෙස පහර දී ඇති අතර, රසික ගුණවර්ධන, ශබීර් මොහොමඩ්, ජේරීන් සැමුවෙල්ස් යන මාධ්‍යවේදීන්ටද දරුණු ලෙස පහර දී තිබේ. මානව හිමිකම් ක්‍රියාකාරිකයකු වූ නීතිඥ නුවන් බෝපගේද ප්‍රහාරයට ලක් විය. ප්‍රහාරවලින් විරෝධතාකරුවන් 48 දෙනෙකු තුවාල ලබා ඇති අතර 9 දෙනෙකු අත්අඩංගුවට ගැනිණි. මෙම ප්‍රහාරය විදෙස් රාජ්‍යතාන්ත්‍රිකයන් විසින් දැඩි ලෙස හෙළාදකින ලදි.

මූලාශ්‍ර: 1. https://www.youtube.com
2. https://divaina.lk

09. **වැල්ලවායේ මාධ්‍යවේදී ඉන්දික ගරුසිංහ පළ කළ ෆේස්බුක් පෝස්ටුවක් සම්බන්ධයෙන් පොලිස් නිලධාරියකු කළ පැමිණිල්ලක් මත මාධ්‍යවේදියා පොලිසියට කැඳවීම.**

'නිල ඇඳුමේ බලයෙන් ඉන්ධන ජාවාරමේ යෙදෙන නිලධාරියකු පිළිබඳව එම පෝස්ටුවේ සඳහන් වූ අතර, වැල්ලවාය පොලිසියේ බණ්ඩාර නැමති උප පොලිස් පරීක්ෂකවරයකු අදාළ පැමිණිල්ල ඉදිරිපත් කර තිබිණි. පෝස්ටුව පළ කළ මාධ්‍යවේදියා මෙන්ම ඊට ප්‍රතිචාර දැක්වූ පිරිසක්ද පොලිසියට කැඳවා තිබිණි. පසුව පැමිණිල්ල විභාගයට නොගෙනම අවසන් කිරීමට පොලිස් ස්ථානාධිපතිවරයා තීරණය කර තිබේ.

මූලාශ්‍රය: FMM Media Rights Monitoring Desk

10. **Xposure News මාධ්‍ය ආයතනයේ කාර්යාලය පිහිටි නිවාස සංකීර්ණයට ඇතුළු වූ නාඳුනන පිරිසක් එහි සේවය කරන මාධ්‍යවේදීන් පිළිබඳ තොරතුරු විමසීම.**

ජූලි 27 වැනිදා කොළඹ මලලසේකර මාවතේ පිහිටි මෙම නිවාස සංකීර්ණය වෙත පැමිණි පිරිස එහි ආරක්ෂක නිලධාරීන්ට පුද්ගලයන් කිහිප දෙනෙකුගේ ඡායාරූප පෙන්වා ඔවුන් එම පරිශ්‍රය තුළ සිටින්නේ දැයි විමසා ඇති අතර, එම පරිශ්‍රයේ සීසීටීවී කැමරා පරීක්ෂා කිරීමට අවශ්‍ය බව පවසා තිබේ. මෙම සිදුවීම හෙළාදකින ඩිජිටල් මාධ්‍යවේදී එකමුතුව (DJC) පවසන්නේ එය පොලිසියේ ක්‍රියාවක් බවයි.

මූලාශ්‍රය: https://www.dailymirror.lk

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 19ක් ජූලි මාසය තුළ නිරීක්ෂණය විය. එයින් බොහොමයක් ජනාධිපතිවරයාට හා රජයට ඉල්ලා අස් වන ලෙස බල කරමින් පැන නැගුණු විරෝධතාවලට සම්බන්ධ සිදුවීම් වේ. අධිකරණ නියෝග කඩ කිරීම හා පොදු දේපළවලට හානි කිරීමේ චෝදනා මත අරගලයේ ක්‍රියාකාරිකයන් මර්දනය කිරීම සඳහා පොලිසිය අඛණ්ඩව කටයුතු කරමින් සිටින බව, නිරීක්ෂණයට ලක් වූ සිදුවීම් අනුව පැහැදිලිව පෙනෙන කරුණකි.**

3 වගුව: 2022 ජූලි : නීතිමය කොන්දේසි - සිදුවීම් 16

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 15 |
| නව නීති පැනවීම් | 01 |
| **එකතුව** | **16** |

01. **ගාලු කොටු පවුර මත විරෝධතාවට හමුදාව බාධා කිරීමට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කිරීම.**

ජූනි 30 වැනිදා ශ්‍රී ලංකාව හා ඔස්ට්‍රේලියාව අතර ටෙස්ට් ක්‍රිකට් තරගයක් පැවැත්වෙන අතරතුර පැවැත්වූ විරෝධතාවකට මෙම බාධා කිරීම සිදු වූ අතර මෙහිදී ආයුධ සන්නද්ධව පැමිණි හමුදා භටයන් උද්ඝෝෂකයන් අත තිබූ විරෝධතා පුවරු උදුරාගෙන විනාශ කරන ලදි. යුද හමුදාපතිවරයා, ගාල්ල හමුදා අණදෙන නිලධාරියා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වගඋත්තරකරුවන් කරමින්, උද්ඝෝෂණයට සහභාගි වූ නීතිඥවරුන් දෙදෙනෙකු විසින් මෙම පෙත්සම ගොනු කර ඇත.

මූලාශ්‍රය: https://www.news19.lk

02. **රක්ෂිත බන්ධනාගාරගතව සිට ඇප මත මුදාහැරුණු ගෝල්ෆේස් අරගලයේ ක්‍රියාකාරිකයකු වූ අමල් සංජීව හමුදා භාරයට පත් කිරීම.**

කොළඹ පොලිස් මූලස්ථානය අසල නොසන්සුන්කාරී ලෙස හැසිරීම හා රජයේ දේපළවලට අලාභ හානි සිදු කිරීමේ චෝදනාව මත ජූනි 20 වැනිදා ඔහු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. ජූලි 6 වැනිදා නඩුව කැඳවූ අවස්ථාවේදී ඔහුට ඇප නියම වූ නමුත්, අදාළ සැකකරු හමුදාවෙන් නිසි පරිදි අස් නොවූ පුද්ගලයකු බව පවසමින් හමුදා නිලධාරීන් විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඔහු හමුදාව භාරයට පත් කිරීමට කොටුව මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

මූලාශ්‍රය: https://begnasonline.com

03. **භික්ෂූන්වහන්සේලා විසින් සංවිධානය කර තිබූ සත්‍යග්‍රහයකට එරෙහිව, පොලිසිය අධිකරණයෙන් තහනම් නියෝගයක් ලබා ගැනීම.**

ජූලි 7 වැනිදා කොළඹ කොටුව ඕල්කට් මාවතේ බෝධිරුක්ඛාරාම විහාරස්ථානය ඉදිරිපිටදී මෙම සත්‍යග්‍රහය පැවැත්වීමට නියමිතව තිබුණු අතර එහි සංවිධායකයින් වන පාහියංගල ආනන්ද සාගර, උලපනේ සුමංගල, කළුබෝවිල පදුම යන භික්ෂූන් වහන්සේලාට එම ප්‍රදේශයට ඇතුළු වීම තහනම් කරමින් අලුත්කඩේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් මෙම නියෝගය නිකුත් කෙරිණි.

මූලාශ්‍රය: https://lankasara.com

04. **විරෝධතාවලට එරෙහිව මිලිටරි බලය යෙදවීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් යොමු කිරීම.**

ජූලි 9 සහ 13 දිනවල කොළඹ පැවති උද්ඝෝෂණවලදී විරෝධතාකරුවන්ට එරෙහිව යුද හමුදාව, පොලිස් විශේෂ කාර්ය බලකාය හා පොලිසිය විසින් සාතිශය බලය යෙදවීම ගැන කඩිනම් විමර්ශනයක් ඉල්ලා සිටින පෙත්සමක් වෘත්තීය සමිති හා බහුජන සංවිධාන එකමුතුව විසින් ජූලි 15 වැනිදා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට බාරදෙන ලදි.

මූලාශ්‍රය: https://twitter.com/JDSLanka

05. **රක්ෂිත බන්ධනාගාරගත කර සිටි අරගලයේ ක්‍රියාකාරිකයින් තිදෙනෙකු ඇප මත නිදහස් කිරීම.**

ජූනි 09 දා කොටුව පොලිස් මූලස්ථානය ඉදිරිපිට විරෝධතාවක නිරත වී මහජන දේපළවලට හානි කිරීමේ චෝදනාව මත ජූනි 22 වැනිදා රක්ෂිත බන්ධනාගාරගත කෙරුණු ළහිරු වීරසේකර, රතිඳු සේනාරත්න සහ පූජ්‍ය රත්කරව්වේ ජිනරතන හිමි ජූලි 1 වැනිදා ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: https://mawbima.lk

06. **ජනාධිපති මන්දිරය අසල උද්ඝෝෂණයක නිරත වූ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර ඇතුළු 09 දෙනෙක් අත්අඩංගුවට ගැනීම.**

ජූලි 6 වැනිදා මෙම පිරිස ජනාධිපති මන්දිරයේ පිවිසුම් දොරටුව අසලදී අත්අඩංගුවට ගෙන බස් රථයක නංවාගෙන වරාය පොලිසියට රැගෙන ගිය අතර පසුව පොලිස් ඇප මත නිදහස් කෙරිණි. මෙම උද්ඝෝෂණය වාර්තා කිරීමට පොලිසිය ජනමාධ්‍යවේදීන්ට ඉඩ නොදුන් අතර ඒ පිළිබඳව තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය විසින් මානව හිමිකම් කොමිසමට පැමිණිලි කරන ලදි.

මූලාශ්‍රය: https://www.themorning.lk

07. **ගාලුමුවදොර බණ්ඩාරනායක ප්‍රතිමාව අසල රැඳී සිටි අරගලකරුවන් සිව් දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

රෝහණ කුමාර, චානක මධුසංඛ, චන්ද්‍රදාස ඩික්සන් සහ මොහොමඩ් ෆාරුක් සුම්රි යන අය මෙසේ අත්අඩංගුවට ගැනුණු අතර, ප්‍රතිමාවේ මීටර් 50ක අරය තුළ කිසිවකුට රැස්වීම තහනම් කරමින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ජූලි 20 වැනිදා නිකුත් කළ නියෝගය කඩ කිරීම සම්බන්ධයෙන් ඔවුන් අත්අඩංගුවට ගත් බව පොලිසිය සඳහන් කළේය. ජූලි 26 වැනිදා ඔවුන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව, ජූලි 29 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරත කෙරිණි.

මූලාශ්‍රය: https://www.themorning.lk

08. **ජන අරගලයේ ක්‍රියාකාරිකයකු හා නිදහස් මාධ්‍යවේදියකු වන ඇන්තනි වේරංග පුෂ්පික ද සිල්වා අත්අඩංගුවට ගැනීම.**

ජූලි 27 වැනිදා කොළඹ පිටකොටුව ඔස්සේ බස් රථයකින් ගමන් ගනිමින් සිටියදී සිවිල් ඇඳුමින් සැරසුණු පිරිසක් ඔහු අත්අඩංගුවට ගත් අතර එය බලහත්කාරයෙන් පැහැරගෙන යෑමක් ලෙස ආන්දෝලනයට ලක් විය. පසුව පොලිසිය පැවසුවේ මැයි 19, ජුනි 9 සහ ජුනි 10 යන දිනවල අධිකරණ නියෝග කඩ කරමින් උද්ඝෝෂණ පැවැත්වීම ඇතුළු චෝදනා මත කොළඹ අපරාධ කොට්ඨාසය මගින් ඔහු අත්අඩංගුවට ගත් බවයි. ඔහු කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, අගෝස්තු 9 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කෙරිණි.

මූලාශ්‍රය: https://www.thecolombopost.org

09. **අරගලයේ ක්‍රියාකාරිකයකු වූ පැතුම් කර්නර් අත්අඩංගුවට ගැනීම.**

ජූලි 13 වැනිදා පොල්දූව මංසන්ධිය අසල විරෝධතා මෙහෙයවීමේ චෝදනාව මත කොළඹ අපරාධ කොට්ඨාසය විසින් ජූලි 28 වැනිදා ඔහු අත්අඩංගුවට ගනු ලැබූ අතර කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අගෝස්තු 04 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

මූලාශ්‍රය: http://sinhala.adaderana.lk

10. **වැඩබලන ජනාධිපතිවරයා විසින් හදිසි නීතිය පැනවීම හා පාර්ලිමේන්තුව මගින් එය සම්මත කිරීම.**

මහජන ආරක්ෂක පනතෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ජූලි 18 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි හදිසි නීතිය පැනවීමට වැඩබලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ කටයුතු කළ අතර අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදනයක් නිකුත් කෙරිණි. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඇතුළුව ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සීමා කෙරෙන රෙගුලාසි ඊට ඇතුළත් වේ. ජූලි 27 වැනිදා හදිසි නීතිය වැඩි ඡන්ද 57 කින් පාර්ලිමේන්තුවේදී සම්මත විය.

මූලාශ්‍රය: https://theleader.lk

11. **ඉන්ධන පිරවුම්හලක් අසලදී පොලිස් පහරදීමක් වීඩියෝගතකළ සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු වූ රවීෂ තිලකවර්ධන පොලිසිය මගින් අත්අඩංගුවට ගැනීම.**

අයිඩීඑච් ප්‍රදේශයේ ඉන්ධන පිරවුම්හලක් අසලදී ජූලි 26 වැනිදා පොලිසිය සිදු කළ පහරදීමක් වීඩියෝගත කරමින් සිටියදී පොලිස් නිලධාරීන් ඔහුට පරුෂ වචනයෙන් බැණවැදී අත්අඩංගුවට ගෙන ඇති අතර, පැය කිහිපයකට පසුව නීතිඥවරුන්ගේ මැදිහත්වීම මත ඔහු නිදහස් කර තිබේ.

මූලාශ්‍රය: https://www.facebook.com

12. **අරගලයේ ප්‍රමුඛ ක්‍රියාකාරිකයන් 6 දෙනෙකුට විදෙස් ගමන් තහනම් කිරීමේ අධිකරණය නියෝගයක් පැනවීම.**

මුදල් අමාත්‍යාංශයේ හා ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රවේශය අවහිර කරමින් උද්ඝෝෂණයක නිරත වීමේ චෝදනාවට අදාළව කොටුව පොලිසිය කළ ඉල්ලීමකට අනුව, වසන්ත මුදලිගේ, ජෝසප් ස්ටාලින්, ලහිරු වීරසේකර, රංග ලක්මාල් දේවප්‍රිය, චිරංග ගුණසේකර, අමිල ජීවන්ත පීරිස් පියතුමා යන ක්‍රියාකාරිකයන්ට එරෙහිව ජූලි 25 වැනිදා මෙම නියෝගය පනවන ලදි.

මූලාශ්‍රය: http://www.adaderana.lk

13. **අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ධානිෂ් අලි ගුවන්යානයක් තුළදී අත්අඩංගුවට ගැනීම.**

ජූලි 26 වැනිදා ඩුබායි බලා පිටත්වීම සඳහා කටුනායක ගුවන්තොටුපළේ ගුවන් යානයක් තුළ සිටියදී අපරාධ පරීක්ෂණ නිලධාරීන් විසින් ඔහු අත්අඩංගුවට ගන්නා ලදි. මෙම අත්අඩංගුවට ගැනීම දැඩි ආන්දෝලනයට ලක් වූ අතර, පොලිසිය සඳහන් කළේ අධිකරණයෙන් නිකුත් කළ වරෙන්තුවකට අනුව අත්අඩංගුවට ගැනීම සිදු කළ බවයි. උද්ඝෝෂණවල නිරතවීමට අදාළව ඔහුට එරෙහිව අවස්ථා කිහිපයකදී පොලිසිය අධිකරණයට කරුණු වාර්තා කර ඇති අතර ඉන් එක් අවස්ථාවකට අදාළව අධිකරණයේ පෙනී නොසිටීම සම්බන්ධයෙන් එම වරෙන්තුව නිකුත් කර තිබිණි. ජූලි 27 වැනිදා ඔහු කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අගෝස්තු 5වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කෙරිණි.

මූලාශ්‍ර: 1. https://www.newsfirst.lk
2. https://www.bbc.com

14. **ජනාධිපතිවරයා විසින් නිකුත් කර ඇති හදිසි නීති රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදනය බල රහිත කරන ලෙස ඉල්ලා මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීම.**

    මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු කොමසාරිස්වරියක වන අම්බිකා සත්කුණනාදන් විසින් ඉදිරිපත් කරන ලද මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස ජනාධිපතිවරයා වෙනුවෙන් නීතිපතිවරයා, හිටපු ජනාධිපති ලේකම් ගාමිණී සෙනරත්, වත්මන් ජනාධිපති ලේකම් සමන් ඒකනායක, ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න යන අය නම් කර ඇත.

    මූලාශ්‍රය: https://twitter.com/ambikasat

15. **'ගෝඨාගෝගම' ප්‍රහාරයේ වින්දිතයන්ට පොලිසිය වන්දි ගෙවිය යුතු යැයි මානව හිමිකම් කොමිසම තීරණය කිරීම.**

    'ගෝඨාගෝගම' අරගලභූමියට මැයි 9 වැනිදා ආණ්ඩු පක්ෂ ආධාරකරුවන්ගෙන් එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් දීර්ඝ ලෙස කරුණු විමර්ශනය කිරීමෙන් අනතුරුව කොමිසම නිගමනය කර ඇත්තේ ප්‍රහාරය වැළැක්වීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වගකිවයුතු බවයි. වින්දිතයන්ට වන්දි ලබාදීම, වගකීම් ඉටු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම, මෙවැනි තත්ත්වයක් යළි ඇති නොවීම සඳහා පියවර ගැනීම ඇතුළු නිර්දේශ ගණනාවක් අදාළ වාර්තාවෙහි සඳහන් වේ.

    මූලාශ්‍රය: https://theleader.lk

16. **උද්ඝෝෂණයකට සහභාගි වීම හේතුවෙන් බේරුවල ඉස්මත් මවුලවි අත්අඩංගුවට ගැනීම.**

    වෘත්තීය සමිති හා බහුජන සංවිධාන එකමුතුව විසින් ජූලි 11 වැනිදා කොටුව පොලිස් මූලස්ථානය ඉදිරිපිට පැවැත්වූ උද්ඝෝෂණයට සහභාගි වීම හේතුවෙන් අයුතු ජනරාශියකට සම්බන්ධ වීමේ චෝදනාව මත ජූලි 28 වැනිදා මාලිගාවත්තේදී ඔහු අත්අඩංගුවට ගන්නා ලදි. අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු අගෝස්තු 06 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

    මූලාශ්‍රයථ: https://twitter.com/JDSLanka

---

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' සහ දර්ශකයට අයත් වන එක් සිදුවීමක් මෙහි ඇතුළත් වේ. එසේ වුවද වෙනත් දර්ශක යටතේ සඳහන් කර ඇති හදිසි නීතිය පැනවීම, උද්ඝෝෂකයන්ට ප්‍රහාර එල්ල කිරීම ආදී අවස්ථාවලදී ජාතික හා ජාත්‍යන්තර සංවිධානවලින් හා රාජතාන්ත්‍රිකයින්ගෙන් පළ වූ ප්‍රතිචාර විශාල සංඛ්‍යාවක්ද මෙම දර්ශකය නියෝජනය කරයි. ඒවා වෙන් වෙන් වශයෙන් සඳහන් කළ නොහැකි වීම වාර්තාවේ සීමාවකි.**

**4 වගුව: 2022 ජූලි : ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 01**

| **දර්ශකය** | **වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව** |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 01 |
| **එකතුව** | **01** |

01. **ජූලි 18 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන ජනාධිපතිවරයා විසින් හදිසිනීතිය පැනවීම සම්බන්ධයෙන් නීතිඥ සංගමය විරෝධය පළ කිරීම.**

    මෙම හදිසිනීති රෙගුලාසි මගින් පුරවැසියන්ගේ භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස උල්ලංඝනය වන බවත්, හදිසි නීති රෙගුලාසි, නීත්‍යානුකූල අදහස් පළ කිරීම යටපත් කිරීමට, උද්ඝෝෂණ වැළැක්වීමට හෝ අත්තනෝමතික ලෙස පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට යොදා නොගත යුතු බවත් එම සංගමයේ විධායක සභාව විසින් නිකුත් කර ඇති නිවේදනයේ දැක්වේ.

    මූලාශ්‍රය: https://www.youtube.com

## මාධ්‍යයේ ස්වාධීනත්වය

**මාධ්‍යයේ ස්වාධීනත්වය යන සංරචකයට, මාධ්‍ය ආයතනයක් තුළ මාධ්‍යවේදීන්ගේ ස්වාධීනත්වය, විදෙස් මාධ්‍යවල කර්තෘමණ්ඩල ස්වාධීනත්වය, දේශපාලනඥයින්ගේ, ව්‍යාපාරික බලවතුන්ගේ හා ආගමික හෝ වෙනත් (බාහිර) කණ්ඩායම්වල බලපෑම්වලින් මාධ්‍යයේ ස්වාධීනත්වය, වෙළෙඳ දැන්වීම් ලබා දීමෙන් හෝ නොදීමෙන් අන්තර්ගතයට බලපෑම් කිරීම යන දර්ශක අයත් වේ. අරගලකරුවන් රූපවාහිනියට බලපෑම් කිරීම, බාහිර බලපෑම්වලින් ස්වාධීනත්වය යන දර්ශකයට අදාළ වේ.**

**5 වගුව: 2022 ජූලි : මාධ්‍යයේ ස්වාධීනත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| බාහිර පාර්ශ්වවල බලපෑම්වලින් ස්වාධීනත්වය | 01 |
| **එකතුව** | **01** |

1. **ජාතික රූපවාහිනියට ඇතුළු වූ උද්ඝෝෂකයින් පිරිසක් එහි වැඩසටහන් අන්තර්ගතය සම්බන්ධයෙන් බලපෑම් කිරීම.**

   රූපවාහිනී පරිශ්‍රය ඉදිරිපිට උද්ඝෝෂණයක නිරත වූ විශාල පිරිසක නියෝජිතයින් ලෙස එම පරිශ්‍රයට ඇතුළු වූ ධානිෂ් අලී සහ චමින්ද කැලුම් ප්‍රිය අමරසිංහ යන උද්ඝෝෂකයින්, රූපවාහිනී විකාශන කටයුතු නතර කරන ලෙසත්, මින් ඉදිරියට අරගලයට සම්බන්ධ පුවත් පමණක් විකාශනය කළ යුතු බවටත් එහි ප්‍රධානීන්ට බලපෑම් කළ අතර ස්වධීන රූපවාහිනිය සහ ගුවන්විදුලියේ විකාශන කටයුතුවලටද උද්ඝෝෂකයන්ගේ බලපෑම් සිදු විය. නිදහස් මාධ්‍ය ව්‍යාපාරය, මේ පිළිබඳව විරෝධය පළ කරමින් නිවේදනයක් නිකුත් කළේය.

   මූලාශ්‍රය: https://www.facebook.com

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි- ජූලි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි - ජුනි | | 2022 ජූලි |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 35 | | 10 |
| නීතිමය කොන්දේසි | 43 | 14 | 16 |
| මාධ්‍යයේ ස්වාධීත්වය | 05 | | 01 |
| වෘත්තීයවේදීත්වය | 03 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 11 | 01 | 01 |
| **එකතුව** | **97** | **15** | **28** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-ජුනි මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25